# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I - 2023 ජූලි

## අනුමාන ප්‍රශ්න පත්‍රය

## (101) මූල්‍ය ගිණුම්කරණය

## (Financial Accounting)

සැකසුම: චන්දිම ප්‍රභාත්

*[B.Sc. Accounting (special) USJ (UG), CA (Finalist), AAT (Passed Finalist), CMA (Passed Finalist), AAT & CMA Prize Winner]*

---

# A කොටස

## 01 වන ප්‍රශ්නය

1.1. ගිණුම්කරණයේ මූලික අරමුණු වන්නේ කුමක්ද?
   1. ක්‍රමවත් අයුරින් වාර්තා තබා ගැනීම
   2. ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
   3. ආයතනයක ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම
   4. ව්‍යාපාරයේ දේපල ආරක්ෂා කරගැනීම

1.2. පහත සදහන් ඒවා අතරින් ගිණුම්කරණ ඒකකයක ප්‍රභේදයක් නොවන්නේ?
   1. සංකලිත ගිණුම්කරණය
   2. රාජ්‍ය ගිණුම්කරණය
   3. පුද්ගල ගිණුම්කරණය
   4. ව්‍යාපාර ගිණුම්කරණය

1.3. **ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව ඒකාකාරිත්වයක් සහිතව යොදාගත යුතුය**. මෙම ප්‍රකාශයට අදාළවන ගිණුම්කරණ සංකල්පය කුමක්ද?
   1. යථානුරූපී සංකල්පය
   2. අඛණ්ඩ පැවැත්ම සංකල්පය
   3. ආරක්ෂණ සංකල්පය
   4. සංගතතා සංකල්පය

1.4. ව්‍යාපාරයක අයිතිකරුවන් විසින් කරනු ලබන දායකත්වයකින් හැර වත්කම් වැඩි වීමේ හෝ වගකීම් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස හිමිකම් සිදුවන වැඩිවීම හඳුනාගන්නේ,
   1. වත්කම් ලෙසයි
   2. අතිරේක ප්‍රාග්ධන ලෙසයි
   3. ආදායම් ලෙසයි
   4. වගකීම් ලෙසයි

MCVLearning "your virtual learning partner"

1.5. පහත ගණුදෙනු අතරින් හිමිකම වැඩිවීමට හේතුවන්නේ කුමක්ද?

1. ව්‍යාපාරයේ භාවිතය සඳහා රු500 000 ක මෝටර් රථයක් ණයට ගැනීම
2. අයිතිකරු තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ රු 2 000 ක විදුලි බිල ගෙවීම
3. ණයහිමියන්ට ගෙවීම් කිරීමේදී රු 5 000 ක වට්ටමක් ලැබීම
4. අයිතිකරු රු 5 000 ක භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම

1.6. ව්‍යාපාරයක ආදායම් සත්‍ය වශයෙන් ඉපයූ අවස්ථාවේම එම ආදායම් හඳුනාගත යුතු බව පැවසෙන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයෙන්ද?

1. උපලබ්ධි සංකල්පය
2. උපචිත සංකල්පය
3. ආරක්ෂණ සංකල්පය
4. ගැලපුම් සංකල්පය

1.7. 2023 ජනවාරි මාසයට අදාළව වෙළඳ ණයහිමියන් සම්බන්ධයෙන් පහත තොරතුරු ABC ව්‍යාපාරයේ පොත්වලින් උපුටාගන්නා ලදි.

| | (රු) |
|---|---|
| 2023/01/01 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය | 600 000 |
| 2023/01/31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය | 400 000 |
| ආපසු එවුම් | 200 000 |
| ආපසු යැවුම් | 300 000 |
| ලද වට්ටම් | 100 000 |
| ගැණුම් | 3 000 000 |

ඉහත තොරතුරු අනුව, 2023 ජනවාරි මාසය තුළ මුලු ණයහිමි ගෙවීම වන්නේ,

1. 2 800 000
2. 2 900 000
3. 2 500 000
4. 3 300 000

1.8. රාමාගේ ව්‍යාපාරය 2021/04/01 දින රු 3 000 000 කට මෝටර් රථයක් අත්පත් කර ගන්නා ලදි. මෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වන අතර සුන්බුන් අගය රු 300 000 ලෙස ඇස්තමේන්තු කර ඇත. ව්‍යාපාරය හීන වන ශේෂ ක්‍රමය මත 40% ක ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කරයි නම් 2023/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම වන්නේ,

1. 1 080 000
2. 1 200 000
3. 720 000
4. 540 000

1.9. අයිතිකරු තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ ණයහිමියෙකු පියවීම ගිණුම්කරණ සමීකරණයට බලපාන්නේ කෙසේද?

1. වත්කම් අඩුවේ වගකීම් අඩුවේ
2. හිමිකම් අඩුවේ වගකීම් අඩුවේ
3. හිමිකම් වැඩිවේ වගකීම් අඩුවේ
4. වගකීම් අඩුවේ වගකීම් වැඩිවේ

JMCvLearning
"your virtual learning partner"

1.10. ABC ව්‍යාපාරය, කමල්ගේ ව්‍යාපාරයෙන් රු 80 000 තොග ණයට ගත් විට එම ගණුදෙනුව පොදු ලෙජරයේ සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

1. තොග ගිණුම (හර) ණයහිමි කමල්ගේ ගිණුම (බැර)
2. ගැණුම් ගිණුම (හර) ණයහිමි කමල්ගේ ගිණුම (බැර)
3. තොග ගිණුම (හර) ණයහිමි පාලන ගිණුම (බැර)
4. ගැණුම් ගිණුම (හර) ණයහිමි පාලන ගිණුම (බැර)

**1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල ඇති ප්‍රකාශවල සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.**

1.11. අවංක භාවය, අරමුණුගත භාවය යන ඒවා වෘත්තීය ආචාරධර්ම වලට උදාහරණ වේ.

1.12. ණයගැති පාලන ගිණුමක කිසිදු විටෙක බැර ශේෂයක් පැවතිය නොහැක.

1.13. ව්‍යාපාරයක් තම ණයගැතියන්ගෙන් මුදල් රැස්කරගැනීම ව්‍යාපාරයේ ලාභයට/අලාභයට බලපානු ලබයි.

1.14. සියලු ණයට ගැණුම්, ගැණුම් ජර්නලයේ සටහන් කරනු ලබයි.

1.15. භාණ්ඩ ලැබීමේ පත්‍රය මූලාශ්‍ර ලියවිල්ලකට උදාහරණයක් නොවේ.

**1.16 සිට 1.20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1.16. ව්‍යාපාරයක මුදල් පාලන ගිණුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශයේ ශේෂය අතර වෙනසක් ඇතිවීමට බලපාන හේතු ප්‍රධාන වර්ග 03 මොනවාද?

1.17. මූල්‍ය තොරතුරු වල වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ගති ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.

1.18. තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකම වසරක් තුළ රු මිලියනයකින් ඉහළ ගොස් ඇත. කාලච්ඡේදය තුළ ඉපයූ ලාභය රු 500 000 සහ අතිරේක ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට අයිතිකරු රු 600 000 යෙදවූයේ නම්, කාලච්ඡේදයේ ගැනිලි වල වටිනාකම කොපමණද?

1.19. මූල්‍ය ගිණුම්කරණයේ යෙදවුම් සඳහන් කරන්න.

1.20. සුළු මුදල් අග්‍රිමය මාසිකව රු 5 000 වූ ව්‍යාපාරයක ප්‍රධාන මුදල් භාරකරු 2023 මැයි 01 දින රු 4 600 ක මුදලක් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම වශයෙන් සුළු මුදල් භාරකරුට ලබාදුන්නේ නම් 2023 අප්‍රේල් මාසයේ සුළු මුදල් ගෙවීම් වල අගය කොපමණද?

(ලකුණු 40)

JMC VLearning "your virtual learning partner"

# B කොටස

## 02 වන ප්‍රශ්නය

සිසිරගේ ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරු විසින් 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී, එම ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම අසමාන විය. වෙනස වූ රු 35 000 අවිනිශ්චිත ගිණුමට හර කරන ලදි. මෙම ව්‍යාපාරයේ කෙටුම්පත් ලාභය රු 785 000 විය.

පහත වැරදි පසුව හඳුනාගන්නා ලදි.

1. රු 20 000 ක අත්පිට ගැනුම්, ගැනුම් ගිණුමේ රු 2 000 ලෙස සටහන්ව තිබූ අතර, රු 40 000 ක ගොඩනැගිලි ගුලී ගෙවීම, ගොඩනැගිලි කුලී ගිණුමේ රු 58 000 ලෙස සටහන්ව තිබුණි. කෙසේ වෙතත් මෙය මුදල් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණි.

2. රු 100 000 ක ගොඩනැගිලි අලුත්වැඩියා වියදම, ගොඩනැගිලි ගිණුමට හර කර තිබූ අතර, මෙය මුදල් ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණි.

3. ණයගැතියෙකුට දුන් වට්ටම් රු 7 500 ක් වැරදීමකින් ලද වට්ටම් ගිණුමේ බැරට සටහන් වී ඇත. කෙසේ වෙතත් එය ණයගැති පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණි.

4. අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ගිය රු 20 000 ක මුදල, මුදල් පාලන ගිණුමේ පමණක් සටහන් වීම.

5. රු 300 000 ක විකුණුම් ඉන්වොයිසියක්, සම්පූර්ණයෙන්ම පොත් වලින් මඟ හැරී ඇත.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කිරීම.
2. අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම.
3. නිවැරදි ලාභය ගණනය කිරීම.

(ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

අමිල විසින් 2023 මාර්තු 01 දින ආරම්භ කරන ලද **අමිල ට්‍රේඩර්ස්** හි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

1. 2023 මාර්තු මාසය සඳහා මුදල් ලැබීම් ජර්නලය හා මුදල් ගෙවීම් ජර්නලය පහත පරිදි වේ.

### මුදල් ලැබීම් ජර්නලය (රු)

| දිනය | විස්තරය | වටිනාකම | ලැබීම් විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|---|---|
| | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | ආදායම් | වෙනත් ලැබීම් |
| 03/01 | ප්‍රාග්ධනය | 1 000 000 | | | | 1 000 000 |
| 03/11 | අත්පිට විකුණුම් | 500 000 | 500 000 | | | |
| 03/20 | අමරගෙන් ලැබීම් | 100 000 | | 100 000 | | |
| 03/25 | අත්පිට විකුණුම් | 600 000 | 600 000 | | | |
| 03/28 | ගොඩනැගිලි කුලී | 50 000 | | | 50 000 | |
| 03/30 | කමල්ගෙන් ලැබීම් | 150 000 | | 150 000 | | |
| 03/31 | පොදු ලෙජරයට පිටපත් කලා | 2 400 000 | 1 100 000 | 250 000 | 50 000 | 1 000 000 |

### මුදල් ගෙවීම් ජර්නලය (රු)

| දිනය | විස්තරය | වටිනාකම | ගෙවීම් විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|---|---|
| | | | අත්පිට ගැණුම් | ණයගැති ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් |
| 03/01 | මෝටර් රථ ගැණුම් | 400 000 | | | | 400 000 |
| 03/02 | අත්පිට ගැණුම් | 100 000 | 100 000 | | | |
| 03/05 | නිමල්ට ගෙවීම් | 200 000 | | 200 000 | | |
| 03/15 | වැටුප් ගෙවීම් | 300 000 | | | 300 000 | |
| 03/22 | විදුලිය | 30 000 | | | 30 000 | |
| 03/26 | අත්පිට ගැණුම් | 200 000 | 200 000 | | | |
| 03/28 | සුනිල්ට ගෙවීම් | 300 000 | | 300 000 | | |
| 03/31 | පොදු ලෙජරයට පිටපත් කලා | 1 530 000 | 300 000 | 500 000 | 330 000 | 400 000 |

2. 2023 මාර්තු මස 31 දිනට ගිණුම් පොත් වල පහත ශේෂයන් දකින්නට ලැබුණි

| | (රු) |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | 230 000 |
| වෙළඳ ණයහිමියෝ | 300 000 |
| ලැබිය යුතු ගොඩනැගිලි කුලී | 30 000 |

3. මෝටර් රථය වාර්ෂිකව 15% බැගින් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

4. 2023 මාර්තු මස 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කල යුතු දෑ**

2023 මාර්තු මස 31 දිනට අමිල ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.

(ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

අසංක Soaps යනු සබන් නිෂ්පාදනයේ යෙදී සිටින ආයතනයකි. පහත තොරතුරු 2023 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ පොත් වලින් උපුටාගන්නා ලදී.

| **විස්තරය** | **(රු.)** |
|---|---|
| අමුද්‍රව්‍ය මිලදී ගැණුම් | 3 150 000 |
| 2022 අප්‍රේල් 1 දිනට අමුද්‍රව්‍ය තොගය | 975 000 |
| 2022 අප්‍රේල් 1 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 1 365 000 |
| ගෙන ඒමේ කුලී - අමුද්‍රව්‍ය | 495 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | 2 475 000 |
| කම්හල් සුපරීක්ෂක වේතන | 405 000 |
| විදුලිය | 600 000 |
| කම්හල් යන්ත්‍ර සඳහා ඉන්ධන | 187 500 |
| යන්ත්‍ර (පිරිවැයට) | 3 000 000 |
| ගොඩනැගිලි (පිරිවැයට) | 5 000 000 |

පහත අතිරේක තොරතුරු සපයා ඇත.

1. 2023 මාර්තු 31 ට අවසන් තොග පහත පරිදි ගණනය කර ඇත.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය | 1 050 000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 660 000 |

2. යන්ත්‍ර සහ ගොඩනැගිලි වාර්ෂික පිරිවැය මත 10% බැගින් ක්ෂය කල යුතු අතර ගොඩනැගිලි ක්ෂය වටිනාකමින් 75% ක් පමණක් කර්මාන්තශාලාවට අදාල වේ.

3. සමස්ත විදුලි වියදම කම්හල සහ කාර්යාලය අතර 80% ක් සහ 20% ක අනුපාතය පිළිවෙළින් බෙදා වෙන් කල යුතුය.

4. නිපදවන ලද භාණ්ඩ පිරිවැය 10% ක ලාභයක් සහිතව වෙළඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කල යුතු දෑ**

2023 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා අසංක Soaps ව්‍යාපාරයේ නිෂ්පාදන ගිණුම (නිෂ්පාදන පිරිවැය ලේඛනය) පිළියෙල කරන්න.

(ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

A) කේවල ස්වාමි ව්‍යාපාරයක් වන නිලංග ස්ටෝර්ස් 2023 මාර්තු මාසය තුලදී පහත ගණුදෙනු සිදුවී තිබේ.

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2023.03.03 | අයිතිකරු තම පුද්ගලික මුදලින් ව්‍යාපාරයේ ණයහිමියෙක් වූ නිමල්ට රු. 50 000 ක් පියවා දැමීය. |
| 2023.03.06 | නැවත විකිණීම සඳහා රු. 150 000 ක භාණ්ඩ ලබාගත් අතර ඉන් රු. 80 000 ක භාණ්ඩ අත්පිට මුදලට ලබාගන්නා ලදී. |
| 2023.03.11 | 2023.03.06 දින ණයට මිලදී ගත් භාණ්ඩ වලින් රු. 10 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් ඇණවුම සමඟ නොගැලපෙන නිසා ආපසු හරවා යවන ලදී. |
| 2023.03.16 | රු. 2 000 මුදලක් අයිතිකරු විසින් තම පුද්ගලික ප්‍රයෝජනයට ලබාගන්නා ලදී. |
| 2023.03.21 | වෙළඳ ණයගැතියෙකුගෙන් රු. 80 000 ක මුදලක් ලැබුණි. |
| 2023.03.31 | 2023 මාර්තු මාසයට අදාල විදුලි බිල්පත් අගය රු. 4 000 ක් වූ අතර එය ගෙවන ලද්දේ 2023.04.11 වන දින දීය. |

JMC vLearning
"your virtual learning partner"

**ඔබ විසින් කල යුතු දෑ**

ඉහත සඳහන් එක් එක් ගණුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

(තොග + වෙළඳ ණයගැතියන් + මුදල් = හිමිකම් + වගකීම්)

(ලකුණු 06)

B) සීමිත TUV සමාගමේ 2023.03.31 දිනට මුදල් පාලන ගිණුමේ වාසිදායක ශේෂය රු. 900 000 ක් විය. කෙසේ නමුත් එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවීය.

පසුව කරන ලද විමර්ශනයේදී මෙම වෙනසට හේතු ලෙස පහත දෑ හඳුනාගන්නා ලදී.

1. ණයගැතියෙකු විසින් රු. 160 000 ක මුදලක් සෘජුවම බැංකුවේ තැන්පත් කර තිබුණි.
2. බැංකුව විසින් ස්ථාවර නියෝග මත කල රක්ෂණ වාරික ගෙවීම රු. 80 000 ක් වූ අතර එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
3. බැංකුවේ තැන්පත් කරන ලද රු. 120 000 ක චෙක්පතක් අගරු වී ඇති අතර එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
4. බැංකුවේ තැන්පත් කරන ලද රු. 40 000 ක චෙක්පතක් 2023.03.31 වන විටත් උපලබ්ධි වී නොතිබුණි.
5. සමාගම විසින් නිකුත් කරන ලද රු. 60 000 ක චෙක්පතක් 2023.03.31 වන විටත් ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි.

**ඔබ විසින් කල යුතු දෑ**

1. සංශෝධිත මුදල් පාලන ගිණුම පිළියෙළ කිරීම.
2. බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කර 2023.03.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය ගණනය කරන්න.

(ලකුණු 04)
(මුළු ලකුණු 10)

---

JMC vLearning
"your virtual learning partner"

# C කොටස

## 06 වන ප්‍රශ්නය

අමිල ට්‍රේඩර්ස් යනු අමිලට අයත් තනි පුද්ගල ව්‍යාපාරයකි. 2023 මාර්තු 31 දිනට අමිල ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පහත පරිදි විය.

**අමිල ට්‍රේඩර්ස්**

**2023 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම (රු.'000)**

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණ - (පිරිවැයට) | | |
| ඉඩම | 3 000 | |
| ගොඩනැගිලි | 3 000 | |
| මෝටර් රථය | 3 000 | |
| ලී බඩු | 2 000 | |
| 2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 300 |
| විකුණුම් | | 15 800 |
| 2022.04.01 දිනට තොගය | 3 000 | |
| මිලදී ගැණුම් | 5 000 | |
| ගෙන ඒමේ කුලී | 500 | |
| ආපසු යැවුම් | | 100 |
| ලද වට්ටම් | | 430 |
| ආයෝජන (ජංගම නොවන) | 8 000 | |
| ආයෝජන ආදායම් | | 1 600 |
| ප්‍රචාරණ වියදම් | 100 | |
| බොල් ණය | 400 | |
| දුන් වට්ටම් | 300 | |
| වැටුප් හා වේතන | 600 | |
| විදුලිය | 80 | |
| ගෙවල් කුලී ආදායම් | | 20 |
| වරිපනම් | 120 | |
| බැංකු ණය පොලී | 100 | |
| බැංකු ගාස්තු | 50 | |
| වෙළඳ ලැබිය යුතු දෑ (ණයගැතියෝ) | 1,000 | |
| මුදල් ශේෂය | 800 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ (ණයහිමියෝ) | | 800 |
| 15% බැංකු ශේෂය | | 1,000 |
| ප්‍රාග්ධනය (2022/04/01 දිනට) | | 11,000 |
| | 31,050 | 31,050 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2023 මාර්තු 31 දිනට අවසාන තොගය රු. 300 000 කට අගය කරන ලදී.

2. මෝටර් රථය සහ ලී බඩු 2022.04.01 දිනට මිලදී ගන්නා ලද අතර ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමයි.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂයකට 10% බැගින් |
| මෝටර් රථ | : | වර්ෂයකට 25% බැගින් |
| ලී බඩු | : | වර්ෂයකට 5% බැගින් |

MC vLearning "your virtual learning partner"

3. 2023 මාර්තු 31 දිනට පවතින වෙළඳ ලැබිය යුතු දෑ ශේෂයෙන් රු. 100 000 බොල්ණය ලෙස කපා හැරිය යුතු අතර ඉතිරිය මත 10% වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනයක් (අඩමාන ණය වෙන් කිරීමක්) කල යුතුය.

4. 2023 මාර්තු 31 දිනට පහත දෑ ගිණුම් පොත් වල වාර්තාකර නොතිබුණි.

| | | |
|---|---|---|
| ගෙවිය යුතු විදුලිය | : | රු 20 000 |
| ගෙවිය යුතු ප්‍රචාරණය | : | රු 10 000 |
| ඉදිරියට ගෙවූ වරිපනම් | : | රු 20 000 |

**ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙළ කරන්න.**

1. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2. 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(මුළු ලකුණු 20)

JMC vLearning
"your virtual learning partner"